# යක්ෂ ආත්මයක් දේවත්වාරෝපණයෙන් පිදීම : පිටියේ දෙවි

- වයි.කේ. තිස්ස බණ්ඩාර

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර බද පුරාණ දුම්බර දැනට පවතින ජනප්‍රිය දේව සංකල්පයක් වශයෙන් 'පිටියේ දේව' ඇදහීම හඳුන්වාදෙමු. වර්තමාන පරිපාලන රටාව අනුව වෙන්ව ඇති උඩ දුම්බර, මැද දුම්බර හා පාතදුම්බර යන කලාපවලට අතිරේකව පුරාණ දුම්බරට අයිති සීමාව නිර්ණය කිරීම අපහසු ය. එය හේවාහැට හාරිස්පත්තුවේ කොටසකට හා මාතලේ කොටසකටත් සීමා වූසේ සැළකිය හැකි ය. පොදුවේ ගත්කල්හි වර්තමාන සමස්ත දුම්බර කලාපයේත් හාරිස්පත්තුවේත්, හේවාහැට ප්‍රදේශයේත් උක්ත දේව සංකල්පය බොහෝ කලක සිට පැවතෙන බව ජනශ්‍රැති හා පුරාණෝක්තිවලින් පැහැදිලි වෙයි. වසර හත්සීයයක් පමණ දුරාතීතයක් හිමි මෙම දේව සංකල්පය ආශ්‍රිතව බහු විෂය වූ සංස්කෘතික සාධක දක්නා ලැබේ. මෙම දේව ඇදහීම සම්බන්ධයෙන් පවත්නා අභිචාර විධි රැසකි. පුළුල් පෙදෙසක් තුළ දේවාල රැසක් ඇසුරු කොට පුද ලබන මෙම දෙවියන් වනාහි දේවත්වාරෝපිත එක්තරා යක්ෂ ආත්මයක් බව මෙම සංකල්පයේ සම්භවය අනුව අනාවරණය වෙයි.

දෙවියන් ඇතැයි කියන පිරිසක් මෙන්ම නැතැයි කියන පිරිසක් ද අද සමාජයේ සිටිති. බෞද්ධ අබෞද්ධ භේදයකින් තොරව එම පිරිස නියෝජනය වෙති. දෙවියන් සම්බන්ධයෙන් ත්‍රිපිටකාගත තොරතුරු බහුල ය. මේ ගැන පූජ්‍ය නිවන්දම ධර්ම



කීර්ති හිමි යන්ගේ 'බුදුසමය හා දෙවියෝ' යන කෘතියේ ප්‍රස්තාවනාවෙන් කොටසක් මෙහි උපුටා දක්වනු ලැබේ.

"ආදිකල්පිත යුගයේ පටන් දෙවියන් පිළිබඳ විශ්වාසය මිනිසා තුළ පැවති බවට නොයෙකුත් සාක්ෂි ඇත. ස්වභාවික වස්තූන්ගේ චමත්කාර ජනක අපූර්වත්වයෙන් හා ආරම්මණ විඥානයට හසු නොවන ගුප්ත බලයෙන් අන්දමන්ද වූ ආදිකල්පිත මිනිසා එකී වස්තූන්ට දේවත්වය ආරෝපණය කිරීමෙන් පසු දෙවිවරුන් වශයෙන් කොටසක් බිහි වූහ. මුල දී පැවති විශ්වාසය අනුව 'සියලු බල පරාක්‍රමයෙන් යුත් එක් දෙවියෙක් ඇත' යනුවෙන් ඒක දේවවාදය බිහි විය. පසුව ඒ මතය බැහැර කොට බලපරාක්‍රමයෙන් යුත් දෙවිවරු බොහෝ දෙනෙක් ඇත', යන විශ්වාසය ඉස්මතු ව බහු දේවවාදයක් පැන නැගිණි. දෙවිවරුන්ගේ ගණන ප්‍රමාණය ඉක්මවා යාමේ හේතුව පදනම් කොට එයට පටහැණි අදේවවාදයක් හෙවත් 'දෙවියෙක් නැති ' යන මතය පැතිරිණ. මේ සියලු මතවාද භාරතයෙහි හටගත් අතර නැවත වරක් ඒක දේව වාදයක් මැද පෙරදිගින් බිහි වී එය කතෝලික හා මුස්ලිම් ආගම්වලට පදනම විය. මේ දේව සංකල්පය මෙසේ පැතිරෙමින්, හැකිළෙමින් නැවත දිග හැරෙමින් දිගට ම පවත්නා නමුත් එදා පටන් අද දක්වා ත් දෙවියන් ගැන ඒකමතික පිළිගැනීමක් ලෝකයා අතර නැත. වර්තමාන සමාජය අතර දෙවියන් පිළිබඳ ව ප්‍රමුඛ පිළිගැනීම් දෙකක් ඇත. ඉනුත් ප්‍රධාන වන්නේ දෙවියන් යනු මිනිසුන්ට නැති විශේෂ බලපරාක්‍රමයන්ගෙන් සමන්විත මහත් යස ඉසුරෙන් හා රූප සම්පත්තියෙන් අනූන එක්තරා පුද්ගල කොට්ඨාසයක් බව ය. ඔවුන් සතුටු කිරීමෙන් තමන්ට අවශ්‍ය දේ කරවා ගත හැකි බව ඒ මතය ගත්තවුන්ගේ මතය යි. දෙවැන්න නම් දෙවියන් නමින් පිරිසක් නැති බවත් ඒ වනාහි මිනිසුන්ගේ සිත්තුළ පමණක් පවත්නා හුදු මනඃකල්පිත විශ්වාසයක් බවත් ය."[1]

සිංහල බෞද්ධයන් අතර දෙවිවරු රාශියක් පුද පූජා ලබති. ඇතැම් බෞද්ධයන් දේව විශ්වාසය හා එකඟ නොවන බව ද

ප්‍රකට ය. දෙවි දේවතාවුන් ගැන විශ්වාසයට පක්ෂව මෙන් ම විපක්ෂවත් කරුණු බුද්ධ දේශනාවෙන් උපුටා දැක්විය හැකි ය. දහනව වන සියවසේ අග දී දේව පූජාව පිළිබඳ ව වාදයක් ඇති වූ අයුරින් මෙය පෙනේ. ව්‍ය. ව. 1891 දී ගම්පහ මැදගම සිරි සුනන්දාරාමාධිපතිව වැඩ විසූ උඩුගම්පොළ ධර්මකීර්ති හිමියන් විසින් ලියන ලද බෞද්ධ ලබ්ධි විසෝධනිය නම් පොතෙහි ලා බෞද්ධයන් අතර පවතින දෙවිවරුන් පිදීමේ සිරිත අබෞද්ධ චාරිත්‍රයකැයි පෙන්වා දෙන ලදි. මීට පිළිතුරු වශයෙන් කොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස ස්ථවිරයන් වහන්සේ සදාචාර විභාවනිය (1904) නම් කෘතිය ලියමින් දෙවියන් පිදීම බෞද්ධ ලබ්ධියට විරුද්ධ නොවන බව පෙන්වා දුන් සේක. මෑතක පමණක් නොව බුදුරජුන් ජීවමාන අවධියෙහි පවා දේව විශ්වාස පිළිබඳ මතභේද පැවති බවට සාධක ඇත.[2]

හූ නෙවිල් පුස්කොළ පිටපත් හතරකින් කරුණු උපුටා ගෙන (අලංකාරවත් ව) පිටියේ දෙවියන්ගේ විත්තිය සකසා ඉදිරිපත් කර ඇත. ඒ අතරින් සොළී කුමාර දේව නම් කෘතිය ගැන මෙසේ කියයි : කුමාරයා පැදවූ රථයට යට වී වස්සාගේ බෙල්ල කැපී යයි. ඒ අයුරින් ම සොළී රජ සිය පුතාගේ බෙල්ල සිඳ දමයි. මෙබඳු පුවතක් මහාවංශයේ 21 පරිච්ඡේදයේ දැක්වෙයි. එහි එන සොළී රජ අනෙකකු නොව ක්‍රි.පූ. 2 සියවසේ දුටුගැමුණු රජු විසින් පරාජයට පත් කරන ලද එළාර රජු යි. එය පැරණි කතාවක් වන අතර එය නාථ, පිටියේ පුරාණයට අමුතුවෙන් සම්බන්ධ කර ගත් එකක් විය යුතුය (සාමාන්‍ය ගම් වැසියන් කතාවේ මෙම කොටස සවිස්තර ව දක්වනු අසා ඇත්තෙමි) මහාවංශයේ එම පුවත දැක්වෙන්නේ දෙමළ රජු සිය රාජ්‍යය තුළ කෙතරම් නීත්‍යානුකූල ව රාජ්‍යය කළේ ද යන්න පහදා ලීමට ය. එහෙත් සිංහල ජන සංස්කෘතියේ එළාර රජු දැක්වෙන්නේ සිංහල දේශපාලන බලයට එරෙහි ව නිරතුරුව ආක්‍රමණවල යෙදෙන දෙමළ බලයේ සංකේතයක් වශයෙනි. මේ පුවත අනුව සොළී රජුගේ පුතා (පිටියේ නමින් උපන් තැනැත්තා) එම බලවේගයේ ම පුනරුත්පත්තියක් වශයෙන් පැමිණි සිංහල බලය යටපත් කිරීමට උත්සහ ගැනීම නාථ



දෙවියන් පැරදවීමෙන් සංකේතනය වෙයි. සොළී කුමාර කතාවේ වස්සාගේ මරණයත්, කුමාරයා මරා දැමීමත් පිළිබඳ විස්තරවලින් අනතුරුව කුමාරයා යක්ෂයකු ව ඉපිද ලංකාවට අවුත් ගවයින්ට අනදර කළ බව කියැවෙයි. (දැනුත් දුම්බර වැසියන් ගවයින්ගේ ආරක්ෂාව සඳහා පිටියේ දෙවි යදිනු දැක්ක හැකි ය ; ගවයින් කෙරෙහි ඔහු තුළ ඇති බලය කායීමය වශයෙන් සිංහලයන් විසින් අනුකලනාත්මක ව වෙනස් කර ගෙන ඇත). මෙම ලක්ෂණය තව දුරටත් විකාශනය කොට දැක්වෙන පුවතක් අනුව හරකුන්ගේ ආරක්ෂාව සඳහා පිරිත් දෙසීමට වරක් භික්ෂූන් 60 නමක් පැමිණ ඇත. එසේ පැමිණ පිරිත් දෙසමින් සිටිය දී පිටියේ විසින් හරකකුගේ ගාතයක් ඔවුන් අතර දමා ගසන ලදී. මේ දුටු වික්ෂිප්ත වූ භික්ෂුහු හිස අත් ගසා ගත් හ. මෙම පුවත ද නාථ දෙවියන්ගේ තැබීමේ උපතෙහි දැක්වෙන පරිදි පිටියේ දෙවි උපාය හමුවේ නාථ ඇතුළු පිරිස පැරදී ගිය ආකාරයට සමාන පුවතක් වෙයි. මෙයින් පුරාණ කතාව බලය පිළිබඳ තවත් අංශයක් පෙන්නුම් කරයි: ලෞකික මට්ටමේ දී පිටියේ නාථ දෙවියනට වඩා බලවත් වෙයි. වඩාත් සීමිත අයුරින් කිවහොත් පිටියේගේ බලය විශ්වනියාමයේ (cosmic) පහළ මට්ටමේ දී වඩා බවලත් වෙයි.[3]

පිටියේ දෙවි ව ඉන්නේ තම රියෙහි සකට යටකොට වසු පැටවෙකු මැරීමේ වරදට මැරුම් කෑ සොළී කුමාරයෙකි.[4]

සොළී රටේ රජකුට දාව උපන් මේ කුමරා තමා පැද වූ රියට අසු වමැරුණු හෙයින් ඔහු එය හිතාමතා කළේද? එයට දඬුවම් වශයෙන් එම රියට ම යට කොට මරන ලදුව යක් බවට පත් විය. මේ පුවත එළාර රජතුමා ගැන පැවසෙන්නක් හෙයින් පිටියේ දෙවි එළාර රජු මැරූ පුතා යැයි ද විශ්වාසයක් පවතී.[5]

මහාවංශයට අනුව එළාර රජුගේ පුතුයා සම්බන්ධ කථාව මෙසේ ය. "...ඒ රජුගේ එක් පුතෙක් ද දුවක්ද වූහ. ඒ කුමාර තෙමේ රථ නැගී තිසා වැවට යන්නේ මවු සමඟ මග හොත් ඉතා තරුණ වස්සෙකු රියසකින් බෙල්ල ඇක්ම නොදැන මැරුනේ ය.

ඒ දෙන තොමෝ කිපී සිත් ඇත්තී ගොස් යුක්තියේ මිණි ගෙඩිය ගැසුවාය. රජතෙමේ ඒ චක්‍රයෙන් ම පුත්‍රයාගේ හිස සිඳවී.[6]

පිටියේ දෙවි යනු එළාර රජු විසින් මැරවූ එළාර රජුගේ පුතාය. මහා වංශය එළාර රජු ගැන දීර්ඝ විස්තරයක් කරමින් ඔහුගේ යුක්ති ගරුක බව - රජ මැඳුරේ එල්ලා තිබූ යුක්තියේ ඝණ්ඨාරය ගැන රසවත් කතා ඉදිරිපත් කරයි. මේ තොරතුරු මහාවංශ ටීකාවේ හා කාම්බෝජ මහාවංශයේ තවත් වැඩිපුර දක්වයි. එළාර රජුගේ පුතා තිසා වැවට දිය නෑමට යද්දී අශ්වරියට යටවී වසු පැටියෙකු මිය යයි. එළදෙන සාණ්ඨාරය හඬවයි. රජු නඩු අසා තම පුතා වැරදි කරු කර අස් රියට යටකර මරවයි. "මහාවංශය ද එළාර රජු ගැන දක්වන මේ කතාවම ද්‍රවිඩ සාහිත්‍යයේ මනුචෝල සොළී රජු සඳහා ද දක්වා ඇති බව කොඩ්රින්ටන් හා පරණවිතාන පෙන්වා දෙති.[7]

පවත්නා ජනශ්‍රැති සාධක සහ ලිඛිත පුරාණෝක්ති අනුව පිටියේ දෙවියන්ගේ සම්භවය දක්ෂිණ භාරතීය චෝල (සොළී) දේශයේ සම්බන්ධතාවක් සනිටුහන් කරයි. මෙම දෙවියන් සම්බන්ධව මහනුවර සමයේ අග භාගයේ දී ලියවී ඇති පද්‍යාවලි කීපයක් අනුව ඒ විස්තර තව ද පැහැදිලි වේ. පිටියේ දෙවියන්ගේ කවි, පිටියේ දළ මුර කවි සහ පිටියේ සුරිඳු පුවත යන කාව්‍ය පන්ති ඇතුලත් පුස්කොළ පිටපත් කීපයක ම තිබේ. මෙයින් පිටපත් සතරක විස්තර බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ ඇති ලාංකේය පුස්කොළ පොත් සම්බන්ධ ව හ්‍යු නෙවිල් දක්වා තිබේ. ඒවට අතිරේකව පැරණි පිටියේ දේවාලවල කපු පරම්පරා කීපයක් සතුව ඇති පුස්කොළ පිටපත් කීපයක ද මේ දෙවියන්ගේ පහළ වීම සම්බන්ධයෙනුත්, බලය පතුරවා ගැනීම සම්බන්ධයෙනුත්, ක්‍රියාත්මක වීම සම්බන්ධයෙනුත් බොහෝ කරුණු අන්තර්ගත වේ. මා විසින් එකී පුස්කොළ පිටපත් කීපයක් නිරීක්ෂණයට ලක් කරන ලදී. ඒ පිළිබඳ පූර්ණ විස්තර මෙහි නොදක්වන අතර පිටියේ සුරිඳු පුවතේ සංක්ෂිප්ත සටහනක් මෙහි බහාලනු ලැබේ.



පිටියේ සුරිඳු පුවත නම් කෘතිය නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් දොඩම්වල කිවිඳු විසින් රචනා කරනු ලැබ තිබේ. ඒ බව හපුගොඩ පිටියේ දේවාලය සතු පුස්කොළපොත් පිටපත්වල මතු දැක්වෙන කවිවලින් කියැ වේ.

ඒ සුරිඳු තෙද පබඳ
කිවියර බසින් මන නඳ
තුතිකර කියන ලෙද
වලහලෙන් වර නරේන්ද්‍ර හිමි සඳ

පියෙසෙහි දොඩන්වල
කිවියර තුමා මනකල
එ තෙපුල් විණවිපුල
රගෙන මුදුනත පැළඳ එ කමල

ඒ සුරිඳුගේ සසොබනය
යසතෙද විකුම් පමණය
කල් මෙකවි එ දැනමය
එ සිය නවපනසකි සඳනුය

ශක වසිනෙක් දහස
සසිය සතළිස් නවාමස
ගුරුදින නිකිණි මස
මෙ කවි පොත නිමි වස

කවි අංක 222, 223, 224, 225

මෙයින් කියැවෙන්නේ එකී රජුගේ එම කවියා විසින් කවි 159කින් යුතුව මේ පද්‍ය පන්තිය කරන ලද බවයි. එය ලියන ලද්දේ ශක වර්ෂ 1649 යේ නිකිණි මස ගුරුදිනයේ දීය. එනම් ක්‍රි.ව. 1727 අගෝස්තු මස බ්‍රහස්පතින්දා දිනක දී ය. එංගලන්ත කෞතුකාගාරයේ ඇති පිටියේ සුරිඳු පද්‍යාවලියක ආරම්භක කවි සතරක ද මේ බව සඳහන් වේ.[8] එම තුන්වෙනි කවියෙන් කියවෙන පරිදි එකී පද්‍යාවලියේ කාව්‍ය ප්‍රමාණය 169 කි. ඒ බව "... එසිය හැටනවකින් බැඳුනෙය" යන්නෙන් පෙනේ. බ්‍රිතාන්‍ය

කෞතුකාගාරයේ ඇති පිටියේ සුරිඳු පුවත කෘතිය කවි 159 කින් යුතුව නරේන්ද්‍රසිංහ රජු විසින් කරන ලද ආරාධනාව අනුව දොඩන්වල කිවිඳුන් විසින් ලියන ලදැයි හ්‍යු නෙවිල් සඳහන් කරයි.[9] නරේන්ද්‍රසිංහ රජුගේ කාලය ක්‍රි.ව. 1706 සිට 1739 දක්වා වේ.[10] දොඩංවල කිවිඳු නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ දී රජ ගෙදර සේවය කළ කවියෙකු හැටියට සඳහන් වේ. රජුගේ ආරධනය පරිදි පිටියේ සුරිඳු උපත කවි කරන ලද්දේ ද මේ දොඩංවල කිවිඳු විසිනි.[11]

පිටියේ සුරිඳු පුවත පුස්කොළ පිටපත්වල තොරතුරු සහ ජනශ්‍රැතියේ එන තොරතුරු බොහෝදුරට සමානය. එම පුවතට මුල් වශයෙන් කවි 159 ක් ඇතුළත් වුව ද පසු කාලීනව ඊට වඩා කවි එකතුව ඇති බව පුස්කොළ පිටපත් සමීක්ෂණයේ දී හෙළි විය. වර්තමාන ලියුම් කරු සතුව පවතින වසර 110 ක් පැරණි එක් පිටපතක සහ එයට මුල් වූ පැරණි පිටපතක කවි 463 ක් අන්තර්ගත වේ. (මේ සම්බන්ධයෙන් මේ වන විට පේරාදෙණියේ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ සේවාර්ජිත මහාචාර්යය පී.බී. මීගස්කුඹුර මහතාගේ උපදෙස් අනුව යමින් සංස්කරණ හා වෙනත් පර්යේෂණයක නියුක්තව සිටී. ඒ සම්බන්ධ නිගමනයක් මෙහි නොදැක් වේ.) අවශ්‍ය තැන් හිදී කවි උදාහරණ වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

මහාචාර්ය විමලානන්ද තෙන්නකෝන් පිටියේ දෙවියන් පිළිබඳ මෙසේ දක්වයි. "පිටියේ දෙවියන් සඳහා පුද පූජා පැවැත්වෙන දේවාල පිටියේ දේවාල නම් වේ. පිටියේ දෙවියන් අප රටට පැමිණිම පිළිබඳ පුවත මෙසේය. සොළී රටේ සොළොසැවිරිදි රජ කුමරෙක් කාලක්‍රියා කොට දේව යෝනියෙහි ඉපද යක් සෙන් පිරිවරා අහසින් යන්නේ දුම්බර පෙදෙස කෙරෙහි සිත බැඳී හුන්නස්ගිරි කන්දේ වාඩි ලා ගත්තේ ය. එකල හුන්නස් ගිරි කන්ද වටා හැම තැන ම පිටි හෙවත් පිට්ටනි තිබුණේය. මොහු පැමිණීමෙන් පසු තුන් සමයම් වේලාවක හුන්නස් ගිරිය අසල පිට්ටනියකට ගිය සැමටම ජ්වර රෝගය වැළඳුණි. මෙය අලුත් දෙවියන්ගේ තෙද බල නිසා වී යයි සිතා



ඕ හට භාරහාර වීමෙන් රෝගීහු සුවය ලැබූ හ. මේ දෙවියන් නිතර පිටිවල සැරිසරන හෙයින් 'පිටියේ දෙවියෝ' යන නාමය ඔහුට පටබැඳුණි.

පිටියේ දෙවියන් මෙහිඑන විට දුම්බරට අරක් ගෙන එහි වැසියන්ගෙන් පුද සිරි ලබමින් සිටියේ නාථ දිව්‍ය රාජයායි. අලුත් දෙවියන්ගේ පැමිණීමෙන් පසු නාථ දෙවියන්ගේ හාස් කම් මුල්ලට තල්ලු වුණි. ඔහු වෙත පුද පඩුරු පැමිණියේ ද නො වේ. මිනිස්සු ඔහු නොසලකා හැරියෝය. මේ නිසා නාථ දෙවියන් , පිටියේ දෙවියන් පලවා හැරීමට අදහස් කෙළෙන් දෙපක්ෂය අතර යුද්ධයක් සිදු විය. මේ අවිගැටුම සිදු වූයේ දුම්බර යක්ගහ පිටිය නම් ස්ථානයේ දීය. නාථ දෙවියන් තෙරුවන් සරණ ගිය , ප්‍රාණ ඝාතයෙන් වැළකුණු තැනැත්තෙකු බව දත් පිටියේ දෙවියෝ ඇත්,කොටි,වග,වලස් ආදී සතුන් දෙපලු කරමින් නාථ දෙවිඳුන්ට දමා ගසන්නට පටන් ගත්තේ ය. මේ දුටු නාථ දෙවිඳු තැති ගෙන මහවැලි ගඟෙන් එගොඩට පලා ගොස් මහනුවර අසල කන්දක් තම විමානය කර ගත්තේ ය.

මෙයින් පසු පිටියේ දෙවියන්ගේ තෙද බල මහිම රට හැම තැන ප්‍රසිද්ධ විය. තන්හි තන්හි ඔහුට කැප කරන ලද දෙවොල් ඉදි විය. වික්‍රමබාහු, සෙනරත්, රාජසිංහ, වීරපරාක්‍රමබාහු නරෙන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ ආදී රජවරු ද ඔහුට බාරහාර වී පුද පූජා පැවැත්වූ හ. ගුරුදෙණියේ කෙත් යායට ජලය ලබා ගැනීම සඳහා කැපූ ඇල හරහට පිහිටා තිබුණු ගල කඩා ගත නොහැකි වූ වික්‍රමබාහු රජතුමා පිටියේ දෙවියන්ට බාරයක් වූයේ මේ නිසාය. පුදුමයකි. පසු දින ඇල දිගට ම ගල කැඩී , ඇල සෑදී තිබුණි. මෙයින් සතුටට පත් රජතුමා ගුරුදෙණියේ දේවාලයක් ඉදි කොට එය පිටියේ දෙවියන්ට කැප කළේය. යටකී කාර්යය පිටියේ දෙවියන් වේ ඊණින් ගල කැඩීම යයි ප්‍රසිද්ධය. මේ ඇලත් දේවාලයත් මහනුවර-හගුරන්කෙත මහා මාර්ගයේ සතරවැනි සැතපුම් කණුව අසල ගුරුදෙණියේ පිහිටියේ ය"[12]

කොටගම වාචිස්සර හිමියෝ පිටියේ දෙවියන් ගැන මෙසේ සඳහන් කරති. "සිංහලයන් විශ්වාස කරන නමුත් ඔහු සොළී රටින් පැමිණියෙකු බව 'පිටියේ සුරිඳු පුවත' නම් කාව්‍යයෙන් පැහැදිලි වෙයි. 'පිටියේ බණ්ඩර විත්ති‍යෙ' හි දැක්වෙන,

සොළී රට යැයි ය  න
දෙසෙන් නිරිඳෙක් සපැමි  ණ
සඳ රජකම් කර  න
ඔහුට කුමරෙක් මෙලෙස ඇති වූ  න

යනා දී කව්වලින් විස්තර වන අයුරු නම්, සොළී රටින් මෙහි පැමිණ රජ වූ එළාරගේ පුත්‍රයා මොහුය. නොසැලකිල්ලේන් රිය පදවා වසුපැටවකු මැරීම නිසා එළාර මැරූ පුත් කුමාරයා යකෙකු වී ඉපදුණු බවත් ඔහු පසුව පිටියේ සුරිඳු වූ සැටින් මෙ කව් පෙළින් හෙළි වෙයි.

ලක්දිවට පැමිණි ද්‍රවිඩයන් විසින් මෙරටට ගෙන ආ පිටියේ දෙවිඳුන්ට දුම්බර දේවාලයක් ඉදිකොට ඇත. එහි දී මේ දෙවියා විසින් නාථ සුරිඳු පරදවා ජයගත් සැටිත්, ගුරුදෙණියෙහි ඇළක් කැපීමට බාධකව පැවති පර්වතයක් බිඳීම නිසා සෙංකඩගල විකුම්බා රජු මොහු කෙරෙහි පැහැදුණු සැටිත් එම කාව්‍යයෙහි විස්තර කොට ඇත.

මිනිසුන් සහ ස්ත්‍රීන් යක්ෂයන් කිරීමට තරම් බලයක් ඇතැයි සැලකෙණ මොහු ගුණ ගයනු සඳහා ය, වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් දොඩම්වල කිවිඳු විසින් යට කී කාව්‍යය රචනා කරන ලද්දේ. වීරවංස පිටියේ දෙවි, සොළීකුමාර පිටියේ දෙවි ආදී අපර නාමයන්ගෙන් ද හැඳින්වෙන මේ දෙවියා කන්ද උඩරට මිනිසුන්ගේ බලවත් පුදසැලකිලි වලට භාජන වූවෙකි"[13]

නාවුල්ලේ ධම්මානන්ද හිමියෝ පිටියේ සහ නාථ දෙවි පිළිබඳව මෙසේ පවසති "නාථ දෙවියන් පරදවා ජයගත් පිටියේ දෙවියෝ ස්වීය වික්‍රමාතිශය මුළු දුම්බර වැසියන් කෙරෙහි



පමණක් නොව වික්‍රමබාහු සේනාරත්න - රාජසිංහ - වීරපරාක්‍රම නරෙන්‍ද්‍රසිංහ ආදී නරෙන්‍ද්‍රයන් කෙරෙහි බල පවත්වන්නට පටන් ගත් හ. එහෙයින් ඒ සියල්ලෝ ද ඔහු කෙරෙහි ගැති වූහ. ඔහුගේ ම පිහිට සොයන්නට වූහ. ගුරු දෙණියේ කෙතට ජලය ලබා ගැනීම සඳහා කැපූ ඇලේ හරහට පිහිට තිබූ ගල කඩා ගත් නොහැකි වූ වික්‍රමබාහු රජතුමෝ ද පිටියේ දෙවියන්ට භාරයක් විය. පුදුමයකි පසුදින උදේ බලන විට ගල සුණු විසුණු කොට තිබෙනු දක්නට ලැබින. එයින් පහන් වූ රජ තෙමේ ගුරුදෙණියෙහි දෙවොලක් ඉදිකොට පිටියේ දෙයියන්ට කැප කළේ ය.

පිටියේ දෙයියන් කැඩූ ගල හා නරදෙයියන් කැපූ ඇලත් සැදවූ දෙවොලත් මහනුවර-හගුරන්කෙත මහා මාර්ගයේ සතරවැනි සැතපුම් ටැඹ සමීපයෙහි පිහිටි ගුරුදෙණිය නම් ගමෙහිදී අදද ඔබට බැලිය හැකිව තිබේ.

'අමුණුගම - පිලවල ආදී ගම්වල පිහිටි දේවාලයෝ ද මේ රජතුමන් විසින් ම කරවන ලද්දෝය' යි කියති"[14]

දැනට ආසන්න වශයෙන් වසර 190ට පෙර ඩේවි, පිටියේ දෙවියන් ගේ වර්ණ දක්වා තිබේ. ඒ මෙසේ ය. "විෂ්ණු නිල් පාටය, නාථ හා සමන් සුදු පාටය, පත්තිනි කහපාටය, පිටියේ හා කතරගම රතුපාටය"[15]

ඩේවි මෙසේ ද සඳහන් කර ඇත. "දිවයිනේ හා ජාතික ආගමේ ආරක්ෂක දෙවිවරු ද නමස්කාර කරනු ලැබෙති. නාථ, විෂ්ණු, කතරගම, සමන්, පිටියේ යන දෙවිවරු ද පත්තිනි දෙවිඳුව ද මේ ගණයට වැටෙති"[16]

පිටියේ දෙවි "භූතයෙකි යැයි" ඩී.පී. වික්‍රමසිංහ මෙසේ සඳහන් කරයි. "දුම්බර මිටියාවතේ මහවැලි ගඟ අසළ ප්‍රදේශයට අධිගෘහිතව ඒ ප්‍රදේශයේ පුද පූජා ලබන "පිටියේ දෙයියෝ" නමැති භූතයෙකු පිළිබඳ විශ්වාසයක් ඒ ප්‍රදේශවාසීන් අතර පවතී. පිටියේ දෙවියෝ නම් අනෙකෙකු නොව ගෝඨයිම්බර යෝධයාගේ මරණින් පසු ජනිත වූ "අවතරය" යයි සමහරුන්ගේ

මතය නම් ඉන්දියාවෙන් මෙහි පැමිණි වීරක්‍රියා කළ ද්‍රවිඩ මනුෂ්‍යයෙකු මරණින් පසු පිටියේ දෙවි නමින් උපන් බවයි"[17]

මහවැලි ගඟේ 'යහන් ගල' නම් ස්ථානයක් තියෙනවා. එතැන ගඟ පටුයි. එතැනදී ගඟේ වතුර දඬුකොළ බදිනවා එතැන විශාල වළක් තියෙනවා. රාසිං දෙවියො ආයුධ ඇඳුම් උනා තියලා නානවා. පිටියෙ දෙයියො රජ්ජුරුවන්ගෙ රං දුන්න ගන්නා අටියෙන් එම වළේ උල් හිටෙව්වා. පසුව හීනෙන් රජතුමාට ඒ බව කීවා. රජු ඇවිත් බලන කල අර උලක් උඩ දිය සේරෙක් ඉන්නවා දැක්කා. රජු මෙය බලා මෙහෙම කීවා. 'මට මේ පිළිබඳ කියා දුන් දෙවියෙක් ඇත්නම් මේ රන් දුන්න හිමියි' යනුවෙන් හිතා එය ගල උඩින් තැබුවා. එවිට පිටියේ දෙවියෝ එය අරන් ගියා"[18]

කහටපිටියේ ශ්‍රී ධීරානන්ද හිමි, නාථ දෙවි සම්බන්ධයෙන් මෙසේ සඳහන් කර තිබේ. "සෙංකඩගල නාත දෙවියන් පිළිබඳ ජනකථාවක් ද ඇත. ඒ අනුව මේ දෙවියා විසුවේ දුම්බර පෙදෙසේ යැ. එහි වැසියෝ පුදසැලැකුම් ලබමින් සිටින කල් හි සොළී රටින් යක් පිරිසක් හා අලුත් දෙවියන් අවුත් හුන්නස්ගිරියේ වසන්නට විය. පිට්ටනි ඇසුරු කළ මොහු මිනිසුන් භය ගන්වා ලෙඩ හදවා පුදසත්කාර ලබාගත් නිසා මිනිසුන් අතර පිටියේ දෙවි නමින් පතළ විය. නාත දෙවියන් දැහැමි යැ. පිටියේ දෙවි සැඩ යැ. ඔහු සැඩ නිසා බිය පත් ජනයා වැඩිසැලැකිලි දැක් වූයේ ඔහුට යැ. මේ නිසා දෙදෙනා අතර යක්ගහපිටියේ දී සටනක් ඇවිළිණි. ඒ සටනින් පසු බැස ගඟින් එතෙර වැ ගිය නාතදෙවි සෙංකඩගල වාසයට පැමිණියේ යැ. ඔහු විසූ තැන නාථ දේවාලය පිහිටා තිබේ. ඉන් පසු දුම්බරට අධිපති වූ පිටියේ දෙවියන් උදෙසා අරමුණුගම දෙගල්දොරුවේ ද යක් ගහපිටිය අසළ පිලවළ හා ගුරුදෙණියේ ද දේවාලය කරවා ඇත. මේවා ද ගම්පොළ යුගයට අයත් සේ ගත හැක"[19]

බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ ඇති ශ්‍රී ලාංකේය පුස්කොළ පොත් අතර පිටියේ දෙවියන්ගේ කවි පොත් කීපයක් තිබෙන බව කේ.ඩී. සෝමදාස මහතා සඳහන් කර තිබේ.[20]



ඒවා පිටියේ දෙවියන්ගේ කවි නමින් පත්ඉරු 24,13,26,22 බැගින් වූ පිටපත් සතරක් බව එම සඳහට අනුව පැහැදිලි වේ. මේ සමගම පිටියේ දෙවියන්ගේ දලුමුරකවි නම් වූ පත්තිරු හයක පිටපත් ද එහි දැක්වේ.[21]

උඩරට ජනශ්‍රැතියේ නාථ හා පිටියේ දෙවි සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක නිරත වූ ජෝන් කිලීෆර්ඩ් හෝල්ට් මෙසේ සඳහන් කර තිබේ.

"අවසන් වශයෙන් දැක්විය හැක්කේ නාථ 'ප්‍රතිස්ථාපනය' හා පිටියේ 'අනුකලනය' යන දෙකම සිංහල සම්ප්‍රදාය සමකාලීන දේශපාලන යථාර්ථයන් කාලානුරූපව සකසා ගැනීම සමග ම දෙවියන් දෙදෙනාගේ ම බලය සිය වාසිය සඳහා යොදා ගැනීම යි. නාථ 'ප්‍රතිස්ථාපනයෙන්' බෞද්ධයන් ගේ ආගමික චර්යාවෙහි ඒකාන්ත වැදගත්කමත් අධ්‍යාත්මික අගයත් ඇගවෙයි. පිටියේ පිළිගැනීමෙන් සිය ලෞකික කාර්යයන් සඳහා අනුකලනය කෙරෙහි සිංහල නැමියාව පෙන්නුම් කෙරෙයි. එහෙත් පිටියේගේ උරුම තහවුරු කෙරෙනුයේ එකම විමුක්ති පරිසේවනයෙහි ලා ඔහුගේ ද්විතීයික සම්බන්ධතාව ද දැක්වෙන පරිදි ය. බෞද්ධයාගේ මෙම විමුක්ති මාර්ග පරිසේවනයෙහි ලා සහභාගි වීමේ ප්‍රතිඵල වශයෙන් නායක්කර්වරුන් අතුරින් විශේෂයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ අතින් උඩරට බෞද්ධ සංස්කෘතියෙහි පුනරුදයක් ඇති විය. එයින් පසු සිංහලයන්ගේ ඇස් හමුවෙහි ඔවුන්ගේ රාජ්‍ය බලය ද තහවුරු විය."[22]

**පිටියේ දෙවි විසින් යටත්කරන ලද අය**

| | | |
|---|---|---|
| 01. | පල්ලේබැද්දේ | (කවි 206) |
| 02. | වෙල්ලස්සේ බණ්ඩාර | (කවි 207) |
| 03. | භාරගමරාළ | (කවි 208) |
| 04. | ගිරාගම (එතනා)? | (කවි 209) |
| 05. | කටුගම්පළ රාළ | (කවි 210) |
| 06. | පායිංගමුවේ නිසිබණ්ඩාර | (කවි 211) |
| 07. | උඩුවෙලරාළ | (කවි 212) |

08. දැඩි අප්පු (කවි 213)
09. කළු අප්පු (කවි 213)
10. කළු නයිදේ (කවි 214)
11. කම්තිල නයිදේ (කවි 214)
12. පරගම්මන නයිදේ (කවි 214)
13. කුමාරසාමි (කවි 215)
14. මුතුසාමි (කවි 215)
15. බිලිඳුසාමි (කවි 215)
16. පුලියාසාමි (කවි 215) [23]

"මේ කවි කතාව ආරම්භ වන්නේ සොළීරට කාවේරි පුර විස්තරයෙනි. ඒ අනුව සොළීරට අගබිසවට පුතෙකු උපන් බව කියැවෙයි. දෛවඥයින් ප්‍රකාශ කරන්නේ ඒ පුතු ලංකාවෙන් දෙවිකෙනෙකුගේ පුදසත්කාර ලබන බවයි. එම කුමාරයා වැඩී සියලු කලා ශිල්ප ඉගෙන ගනී. ඉන්පසු ලංකාවට ගොස් දුම්බර ප්‍රදේශයේ පදිංචි වෙයි. එහිදී නාථ සුරිඳු මේ කුමාරයා අතින් පරාජයට පත්වෙයි. පෙරකල ලංකාවේ රජකෙනෙකු වූ සඳමහා නිරිඳු විශාල වශයෙන් ගොවිතැන් සඳහා යොමු වූ වත් විශාල ගල් පර්වතයක් නිසා එයට බාධා වූ බවත් කියැවේ. එය වාරිමාර්ග කටයුතු වලට දැඩි සේ බලපා තිබෙන අතර ගල කඩා දැමිය නොහැකි වී තිබේ. ඊට වසර ගණනකට පසු වික්‍රමබා රජ සෙංකඩගල නිර්මාණය කරන විට දී ද මේ පර්වතය හරහා උමගක් හෑරීමට උත්සාහ කළ ද එය අසාර්ථක වී තිබේ. පසුව පිටියේ සුරිඳු බ්‍රාහ්මණයෙකුගේ වෙස් ගෙන සිහිනෙන් පැමිණ ඒ රජුට කියා සිටියේ බිලි පූජාවක් හා රන්කඩුවක් ඔහුට දෙන්නේ නම් (තනතුරක් ද සහිතව) ඔහු එය බිඳ දමන බවයි. යෝජනා කළ පරිදි පූජාව සකස් කළ අතර එදින සැන්දෑවේ ගල දෙවියන් විසින් පුපුරවා හළ බව සඳහන් වෙයි. පසුදින උදෑසන එය රජුට සැලකළ අතර එහි දේවාලයක් ගොඩනගන ලදි. එහි දී ගෝනෙකු බිල්ලට දුන් බවත් එම ස්ථානය වර්තමාන ගෝනාවත්ත නම් වී ලූ. වසර කිහිපයකට පසු සෙනරත් රජතුමාට කිරිගෙන එන මිනිසෙක් ගඟ ලඟට නැවත පැමිණි



විට දුටුවේ තමා ඔරුව එහා ඉවුරට ගොස් තිබෙන බවයි. එවිට පිටියේ දෙවියන්ට යාඥා කළ විට බෝට්ටුව තනිවම (එය හසුරුවන්නෙක් නැතිවම) මෙගොඩට පැමිණි බව සඳහන් වෙයි. පසුව රාජසිංහ රජු දවස, රජු කුණ්ඩසාලේ පදිංචිව සිටි සමයේ රජු ස්නානය සඳහා යන විට ගල් පර්වතයක් මඟ අහුලා තිබුණු බවත් එවිට " මෙය ඉවත් කළ හැක්කේ කාටද, පිටියේ දෙවියන්ට හැර" යනුවෙන් කියා ආපසු මාළිගාවට පැමිණ ඇත. එදින රාත්‍රියේ පිටියේ දෙවියන් ඔහුගේ අනුගාමිකයන් සමඟ එම ගල එම ස්ථානයෙන් ඉවත් කළා පමණක් නොව වෙනත් ගල් තලාවකට ඔසවා තබන ලදි. රජතුමා මෙය දැක එම ස්ථානයට පුද සත්කාර කරන ලදි. තවත් අවස්ථාවක දී දෙවියන් රජතුමාගේ දූන්න හොරකම් කළ අතර, එය දේවාලයේ දක්නට ලැබුණි. (එය කළේ රජතුමා මුවෙකුට විදීමට සූදානම් වන අවස්ථාවේ දීය). මෙම රජු වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ වශයෙන් හඳුන්වයි.

පිටියේ දෙවි මිනිසුන් යකුන් බවට ද පත් කළේ ය. ඔවුන් අතර පල්ලේබැද්දේ, වෙල්ලස්සේ බණ්ඩාර, අභයකෝන් මැතිඳු, භාරගමරාළ, පායින්ගමුවේ බණ්ඩාර, උඩුවෙල රාළ, දැඩි අප්පු, පරගම්මන නයිදේ, කුමාරසාමි, මුත්තුසාමි, බිලිඳුසාමි, හා පුලියසාමි යන අයයි. ඔවුන් ගැන වෙන විස්තර සඳහන් නොවේ. කවියකින් සඳහන් වෙන ආකාරයට දොඩන්වල කිවිඳු විසින් කවි 159 කින් යුත්තව පිටියේ සුරිඳු පුවත නිර්මාණය කරන ලද බව කියවේ. එය නරේන්ද්‍රසිංහ රජුගේ අණ පරිදි කළ බවත් පැහැදිලිය. ඒ රජුගේ රාජ්‍ය කාලය ක්‍රි.ව. 1707-1739 විය. එම කවි නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ පළමු භාගය තුළ දී ලියවෙන්නට ඇත. මා සතුව මේ කවියේ පිටපත් කිහිපයක් තිබේ. එකක පද්‍ය 169 හා අමතර කවි 9 කින් යුක්ත ය. එය රජු වර්ණනා කරමින් ලියැවූවකි. අනෙක් කවි 171 හා ඉහතින් සඳහන් කළ අමතර කවි 09 ක්ද ඇතුලත් ය. තවත් එකක කවි 162 ක් ද අමතර කවි 03 ක් ද වේ. මෙයින් පෙනෙන්නේ මෙම කවි පෙළ කොතෙක් වර්ධනය වූවා ද යන්නයි. පළමුව සඳහන් කළ කවිපෙළ සියවසකට වඩා පැරණිය. අනෙක්වා ද නූතන ඒවා නොවේ.

උදා :

සිරිබර පිටියේ සුරිඳු උදාරය
ගොස කරගෙන සෙත හස සිරිසාරය
තුඟුතර ගිර පොඩි කරමින් නැරය
වැරසර විකුම් දුන් කඩු පාරය

අදහස :

පිටියේ නිරිඳු ඉතා බලවත්ය. ගෙරවුම් හඬින් ඝෝෂා කරමින් මුළු පර්වතයම සුණු විසුණු කරන ලද්දේ ඔහුගේ සර්ව බලසහිත කඩුපහරින් ය.[24]

පිටියේදේව සංකල්පය සම්බන්ධයෙන් විවිධ කථා ප්‍රවෘත්ති මහනුවර ආශ්‍රිත ව ව්‍යවහාරයේ පවතී. ඇතැම් ඒවා කථා මාධ්‍යයෙන් ද ඇතැම් ඒවා ලිඛිත මාධ්‍යයෙන් ද හමු වේ. ලිඛිත සහ ජනශ්‍රැතියේ එන මේ සම්බන්ධ පුවත් සමාන අසමානතාවලින් ද යුක්ත වේ. පිටියේ දෙවියන්ගේ පහළවීම සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පවතින කථා බොහොමයක මූලික තේමාව බොහෝ දුරට සමාන වේ. **පූජ්‍ය ගුන්නෑපාන වජිරඥාණ හිමියෝ** එක්තරා පිටියේ දේවාලයක් ආශ්‍රයෙන් දිගු විස්තරයක් සපයති. එය මෙසේ ය.

"පාතදුම්බර දෙගල්දොරුව විහාරයට බටහිරින් පිහිටි දේවාලයේ වැඩසිටින පිටියේ දෙවියන් පිළිබඳව මහජනයා අතර පැතිර පවත්නා කථා රාශියෙකි. එයින් නාථ දෙවියන් හා පිටියේ දෙවියනුත් අතර ඇති වී යයි කියන භයානක යුද්ධයක තොරතුරු දැක්වෙන ජනප්‍රවාදය ඉතා වැදගත්ය. දුටුගැමුණු එළාර යුද්ධයේ දී දෙ පක්ෂයට ම මිනිසුන්ගේ සහාය ලැබුණු නමුදු මේ යුද්ධයේ දී ඔවුනට සහායට පැමිණියේ යක්කුය. පිටියේ දෙවි වූ කලී **සොළී රජකුට** දාවැ **'සපුලී'** නම් කුමරියක කුස උපන් පුත්‍රයෙකි. කුඩා අවදියෙහි සිට නොහික්මුණු තැනැත්තෙකු වූ ඔහු දිනක් රථයකින් උයනට යද්දී වසු පැටියෙක් රථයේ රෝදයට අසු වී මරණයට පත් විය. දැන හෝ නොදැන කළ මේ වරදට රජකුමරුට වුව ද දඬුවම් කළ යුතු යැයි



මහජනයා කියා සිටි නිසා වරදකරුවකු දඬුවමින් නොමිදිය හැකි යැයි සිතූ පිය රජ තෙමේ ඔහු ජීවග්‍රාහයෙන් අල්වා ඒ කරත්තරෝදයට ම යට කර මැරීමට නියම කළේ ය. රාජ නියමය පරිදි කුමාරයා මරුමුවට පත් කරවන ලදි.

දඬුවම් දීමේ දී වරද සොයා බලා එය සිදු කළ ආකාරයෙන් ම දඬුවම් පැමිණවීම එකල සොළී රටේ පැවති සිරිත විය. ඈත අතීතයේ සිට ම බොහෝ රට වල පැවති මේ සිරිත නිසා අපරාධ කිරීමට රටවාසීහු බිය වූහ. අපරාධ නැති කිරීමේ මූලික හේතුවක් වශයෙන් පැවති මේ සිරිත නිසා රටවාසීහු මහත් සේ විනය ගරුක වූහ.

කරත්ත රෝදයකට යටකර මැරූ කුමාරයා යකෙකු වී ඉපදුනේ ය. මේ යක්ෂ තෙමේ සිය පුරවැසියා පෙළීමේ අදහසින් තොරව දේශාටනයෙහි යෙදීමට සිතා **1029** දී රජ පැමිණි **(කාශ්‍යප) වික්‍රමබාහු** රජු දවස ලක්දිව මඩකලපු ප්‍රදේශයට ගොඩබැස එහි ටික කලක් නැවතී ස්ථිර වාසයට තැනක් සොයමින් හුන්නස්ගිරි ශිඛරය කරා පැමිණියේ ය.

මේ අවදියේ දුම්බර මිටියාවත පිළිබඳ සෑම බිම් අගලක් ම නාතදෙවියන්ගේ අණ සක යටතේ පැවති නිසා යක්ෂ තෙමේ තමාටත් විසීමට සුදුසු තැනක් ලබා දෙන ලෙස දෙවිඳුන්ගෙන් අයැද සිටියේ ය. එහෙත් ඔහුට නැවතීමට තබා කථා කිරීමට තරම්වත් අවසරයක් නාත දෙවියන්ගෙන් නොලැබිණි. ඔහු නැවත නැවතත් මේ ගැන පෙරත්ත කරමින් ගම්වරක්වත් දෙන ලෙස ඉල්ලීය. නාත දෙවියන්ගෙන් ඊට ද පිළිතුරක් නොලද යක්ෂ තෙමේ පියවරක් තරම් ඉඩක් වත් දෙන ලෙස යාඥා කළේ ය. ඔහුගේ අන්තිම ඉල්ලීමට පවා නාථ දෙවියන් ඇහුම්කම් නොදුන් නිසා යුද්ධ කළ යුතු යැයි තීරණය කොට දූතයෙකුගේ මාර්ගයෙන් ඒ බව දෙවිඳුන්ට දන්වා හැරියේ ය.

මේ අවදියේ දී යක්ෂයා තාවකාලික වශයෙන් නැවතී සිටියේ හිස් පිටියක ය. ඒ නිසා දුම්බර වැසියෝ **'පිටියේ දෙවි'** යන නමින් යක්ෂයා හඳුන්වන්නට පටන් ගත් හ. මෙකල දුම්බර සිටි

ද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල

රදල පක්ෂයේ කීප දෙනෙක් ද මරා යක් බවට පත් කරගත් මෙම යක්ෂයා යුද්ධය සඳහා ඔවුන්ගේ ද සහය බලාපොරොත්තු විය. මෙහි දී නිකම් බලා නොසිටි නාථ දෙවියෝ ආයුධ සන්නද්ධ වැ බිම්බර හයක් පමණ යක්ෂ සේනාවක් රැස් කොට පඤ්ච තූර්යනාදයෙන් යුද්ධ භූමිය වෙත පැමිණියෝ දුම්බර මිටියාවත අමු සොහොනක් හෝ අභය භූමියක් හෝ බවට පත්කරවන්නේ මැයි මහ හඬින් ගුගුළහ. එහෙත් තමා බෝධිසත්ව වරයෙකු වූ හෙයින් හැම යුද්ධෝපක්‍රමයක් ම අවිහිංසාවට මුල් තැන දී යෙදිය යුතු විය. අවාසනාවකට මෙන් ඔහුගේ යක්ෂ සේනාංකය ද පිටියේ දෙවියන්ට එක් වීම නිසා සිදු වූයේ නායකයන් දෙදෙනාට පමණක් තනි ව සටන් කිරීමට ය. ඔවුනොවුන් අභිමුඛයෙහි අවියෙන් අවිය ගටා කෙරුණු මේ ද්වන්ද්ව යුද්ධයේ දී පැරදුණු නාථ දෙවියෝ 'පස්ගම' දක්වා පසුබැස්සා හ. දැනුදු නාථ දෙවියන් 'පස්ගම' නැවතී සිටිතැයි පවසති. නාථ දෙවියන්ගේ පරාජය පිළිබඳව දුම්බර වැසියෝ නොයෙක් දුඃඛාලාපයන් කියමින් ශෝක කළහ. පාත දුම්බර ගෝණාවත්තේ දී කෙරුණු මේ යුද්ධය ගැන දුම්බර වැසියන් තුළ පහළ වූ හැඟීම් පැවසෙන ගද්‍ය පද්‍ය නිබන්ධ රාශියක් ම දක්නට ලැබේ. ශෝකය හා අනුකම්පාවත් දනවන සුලු ඒ නිබන්ධ පැරණි සිංහල ජන කවිවලට බෙහෙවින් සමාන ය. පහත දැක්වෙන පද්‍ය ඊට හොඳ නිදසුනකි.

ඈත කපට බුදු වෙන්ව පතන වා
නාත දෙවිඳු යුදයෙන් පරදින වා
දෑත දෙපය කිංකිණි නද දෙන වා
නාත දෙවිඳු දුම්බර හැර යන වා

පිටියේ දෙවියන්ගේ පක්ෂය ගත් යක්ෂයන් ලවා එක් රැයකදී ගුරුදෙණියේ ගල තිස් රියන් කප්පවා යකුන්ගේ හපන්කම් පෙන් වූ අයුරු එහි වැසියන් පවසන්නේ මහත් අභිරුචියකිනි. දැනට කඩවර ගොටු පුදන්නේ මේ ගල ළඟ ය. කඩවරයා ද යකුන් අතර මහා බලවතකු හැටියට ප්‍රසිද්ධ ය. මලය රජුගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ හැටහත් කට්ටුවේ දේවසමාගමට



සහභාගි වීමට යන අතර මගදී ඇති වූ සුළු ප්‍රමාද දෝෂයක් නිසා නියම වෙලාවට සමාජ ශාලාවට පිවිස ගත නොහැකි වූ කඩවරයා එහි රැස්ව සිටි දෙවිවරුන් පන්නා දැමී ය. දේවසමාගම අවසානයේ පැවැත් වූ භෝජන සංග්‍රහයේ දී කඩවරයාගේ කෑම බීම කොටස ඈතින් තැබීමට ද නියම විය. එදා සිට කඩවර ගොටුව දුරින් තබන බව ප්‍රසිද්ධ ය. පහත දැක්වෙන කවියෙන් එය පැහැදිලි වෙයි.

මලය රජුගේ නුවරට වුණු කාරිය
එන්ට බැරිව මග පසු වුණු කාරිය
ඒ උදහස තවමත් අත නැරිය
දුරින් තබව යක් කඩවර කාරිය

මේ කථා ප්‍රවෘත්තියට සත්‍යයේ ආශිර්වාදය ලැබෙතොත් යකුන් පිළිබඳ මෙසේ පවත්නා විවිධ හැඟීම් හා පුද පූජා මතිමාත්‍ර නොවන බව පිළිගත හැකි ය.[25]

පිටියේ දෙවි සම්බන්ධයෙන් පුද පූජා පවත්වනු ලබන ප්‍රධාන දේවාල කිහිපයක් පිහිටි ස්ථාන මතු දැක් වෙයි.

ගුරුදෙණිය
අමුණුගම
පිලවල
දම්මරාව
හුරිකඩුව
උඩුගොඩ
හපුගොඩ
අරුප්පොල
හාරගම
මාරස්සන

මේවාට අමතරව තව ද පිටියේ දේවාල කිහිපයක් පිළිබඳ තොරතුරු එස්.කේ. ජයවර්ධන මහතා සපයා තිබේ. ඔහුට අනුව පිටියේ දේවාල 31 ක් ගැන තොරතුරු වාර්තා වෙයි.[26]

එම දේවාලවල පැරණි බව එකිනෙකට වෙනස් ය. පිටියේ සුරිඳු පුවත (අමුද්‍රිත) පුස්කොළ පිටපතට අනුව පුරාණයේ පැවති දේවාල සංඛ්‍යාව මීට වඩා වැඩි ය. පුරාණ දේවාල සමහරක් මේ වනවිට අභාවයට ගොස් තිබේ. ක්‍රි.ව. 1896 සමය වනවිට මධ්‍යම පළාතේ අකාරාදියට තොරතුරු රැස් කළ ඒ.සී. ලෝරි දේවාල පහක් පිළිබඳ තොරතුරු දක්වයි. එනම් ගුරුදෙණිය, පිලවල, අමුණුගම, උඩුගොඩ, හපුගොඩ යන දේවාලයන් ය. මේ දේවාල අතුරින් ද ප්‍රවේණි පංගු ලැබී ඇත්තේ හපුගොඩ පිටියේ දේවාලයට පමණි. එම දේවාලයේ කපුරාලවරුන් විසින් දේවාලයේ රාජකාරී කටයුතු පැවැත්විය යුතු බවත් වසරකට වරක් මහනුවර පත්තිනි දේවාලයේ බස්නායක නිලමෙට දැකුම් කදක් සහ තුට්ටු අටක් දියයුතු බවත් පුරාණ ලේඛනවල සඳහන් වේ.[27] ඒ සමය වනවිට තිබුණු ඇතැම් පිටියේ දේවාල පිළිබඳ තොරතුරු ලෝරිගේ මධ්‍යම පළාතේ අකාරාදියට අන්තර්ගත නොවී ඇත්දැයි සැක සහිතයි.

පොදුවේ බලනවිට මේ දේවාල බොහෝමයක පුද සිරිත් එක සමාන යි. බැතිමතුන් පැමිණෙනුයේ විවිධ කාරණා පෙර දැරිවය. ඒවා අතර ගොවිතැන්, රැකී රක්ෂා දියුණුව බලාපොරොත්තුවන අවස්ථා ප්‍රධාන වේ. මෙයට අමතරව මතු දැක්වෙන කාරණා සම්බන්ධයෙන් පුද පූජා පවත්වනු ලැබේ. සත්ව පාලනය දියුණුවීම සඳහා, කර්මාන්ත දියුණුව සදහා, රෝග පීඩා මඟ හරවා ගැනීමට, නඩු හබ වලින් ජය ලැබීමට, අන් අයගෙන් ආරක්ෂා වීමට, විභාග ජයලැබීමට, නව රැකියා කර්මාන්ත ආරම්භ කිරීමට, සොර සතුරන් අල්ලා ගැනීමට වැනි කරණා යි.

පිටියේ දෙවියන්ගෙන් විවිධ වූ කාරණා සම්බන්ධයෙන් පිහිට පැතීමට බොහෝ කලක සිට පුරුදුව සිටින බැතිමතුන් පිරිස බොහෝ ය. අතීතයේ දී මෙම දෙවියන් ගෙන් සශ්‍රීකත්වය බලාපොරොත්තුව ඇත්තේ ප්‍රධාන වශයෙන් කරණා තුනක් අනුව බව පුරාණෝක්ති අනුව පැහැදිලි වේ. එනම්,



I. රෝග පීඩා උවදුරු සමනයට
II. කෘෂිකර්මාන්තයේ දියුණුවට
III. සත්ත්ව පාලනයේ දියුණුවට

දැනුදු මේ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවක් ලැබෙන අතර බහු විෂය වූ කරුණු සඳහා පුද පූජා පවත්වමින් භාර භාරවීමට පුරුදුව සිටිති. මෑත කාලයේ ඇතැම් දේවාල ආශ්‍රයෙන් නව අංග කීපයක් වෙනුවෙන් බහුල වශයෙන් භාරභාර වෙමින් පුද පූජා පවත්වති. එනම් විදේශ රැකියා අපේක්ෂාව, විභාග ජය, වාහන ලබා ගැනීම ආදිය යි.

රෝග පීඩා සමනය සම්බන්ධයෙන් විවිධ ආකාරයේ පුද සිරිත් පැවැත්වීම ඇතැම් පිටියේ දේවාල ආශ්‍රයෙන් දක්නට ලැබේ. කිසියම් සුව නොවන රෝගයක් වැළඳී ඇති රෝගියෙක් වෙනුවෙන් ඔහුගේ බාරකරුවන් දේවාලයට පැමිණ භාර වෙති. තෙල්, මල්පහන්, සුවඳ දුම්, බුලත්, කපුරු, හඳුන් කූරු, පඩුරු යනාදිය කපු මහතාට දී අවශ්‍යතාව කියා සිටී. ඒ අනුව කපු මහතා විසින් යාතිකා කරනු ලැබේ. අනතුරුව රෝග සුවවීමෙන් පසුව තිර රෙද්දක්, මල් වට්ටි හතක්, පොල් පැලයක්, රූපයට රූපයක්, වාර්ෂික මංගල්‍යයට එළවලු හෝ අමුද්‍රව්‍ය ආදියෙන් යමක් පූජා වශයෙන් ගෙනැවිත් ඔප්පු කරන බවට භාර වෙති. මෙවැනි රූපයට රූපයක් යනු රෝගියාගේ රුව සංකේත කරමින් රිදියෙන් හෝ සැහැල්ලු ලෝහ තහඩුවක කුඩා ප්‍රමාණයේ රුවක් සකසා ඔප්පු කිරීමයි. අක්ෂි ආබාධයක් නම් ඇසක රුවක් ද, අතක ආබාධයක් නම් අතක රුවක් ද වශයෙනි. පොල් පැලයක් ඔප්පු කරනුයේ ප්‍රාණයට ප්‍රාණයක් වශයෙනි. තිරරෙදි ආදී වස්තු ද රෝගාබාධ සමනය සඳහා භාර වී පුද දෙති.

කෘෂි කටයුතු දියුණුව සම්බන්ධයෙන් විවිධ භාරභාර වීම් හා පුද පූජා මෙම දේවාල ආශ්‍රයෙන් සිදු වෙයි. ගොවිතැන් සදහා කෘමීන්ගෙන් හා වෙනත් සතුන්ගෙන් වන්නාවූ උපද්‍රව මඟ හරවා ගැනීම ප්‍රචලිත පුද පූජා සිරිතකි. ගොයම් කිරි වැදීමට ආසන්න සමයේ ගොවියන් විසින් පුවක් මල් යාතිකා කර තම කුඹුරුවල සතර කොණේ කිණිත බැගින් එල්ලති. මීට තරමක් කලකට පෙර

මෙම ප්‍රදේශවල කෘමි නාශක ඉසීමක් සිදු නොවී ය. මේ කෙම් ක්‍රමයම භාවිතා විය. දැනට මේ තත්ත්වය වෙනස් වෙමින් පවතී. දේවාලයෙන් මල් සාත්තු කර කුඹුරු වලට ඉසිති. මීයන් ආදී සතුන් හෝ කෘමීන්ගේ උවදුරු සමනය වෙයි. වී අටුවලට මැස්සන් ,ඉපියන් ,පණුවන්, කුරුමිණියන්, ආදී සතුන් බෝ වූ විට දේවාලයට පැමිණ මල් සාත්තු කර එම අටුවලට බහාලීමෙන් එම උවදුරු මඟ හරවා ගැනීම පෙර පැවති සිරිතකි. ඇතැම් කාරණා මේ වනවිට සමාජයෙන් බැහැරවෙමින් පවතී. ගොවියන්ගේ කෘෂි කටයුතුවල අග්‍ර කොටස බුදුන්ටත් දෙවියන්ටත් පූජා කිරීම බොදු සිරිතකි. ඒ අනුව මේ ප්‍රදේශයේ ද දෙවියන් වෙනුවෙන් අස්වැන්නෙන් කොටසක් වෙන් කිරීම සිරිතකි. ඇතැම් තැනක කමතේදීම මුල් කොටස් වෙන් කිරීමක් සිදු කෙරේ. පිටියේ දෙවියන් වෙනුවෙන් වෙන්කරනු ලබන මුල් ම වී කොටස වාර්ෂික මංගල්‍යයට භාර දෙනු ලැබේ. පුරාණයේ දී වී එකතු කිරීමට කපුරාලවරු තව ද අත් උදව්කරුවන් සමඟ ගම්වල චාරිකා කළ ද වර්තමානයේ දී එවැන්නක සිදුනොවේ. මේ ක්‍රියාව "අක්යාල" එකතු කිරිම නම් වේ. වර්තමානයේ දී "අක්යාල" දේවාලයට ගෙනැවිත් දෙති.

**සත්ත්ව පාලනය සම්බන්ධයෙන් පුද පූජා,** භාර භාරවීම් සිදු කරනුයේ ගව සම්පත ආශ්‍රයෙනි. පිටියේ දෙවියන් ගේ සම්භවය කථා පුවතකට අනුව ,ගව පැටියෙකු රියසකට යටකොට මැරීම නිසා මරණ දඬුවම් ලැබූ සොලි කුමරු යක්ෂව උපන් බවත්, අනතුරුව ඔහු ගවයන්ට සෙත සළසන බවත් පුරාණෝක්තිවල සඳහන් ය. ඒ සිද්ධිය සිහිපත් කරමින් බැතිමත්තු ගව පාලනයේ දී මෙම දෙවියන් වෙනුවෙන් භාර භාර ඔප්පු කරති. ගවයන් ට අලුතින් පැටව් ඉපදීමෙන් පසුව ප්‍රථම කිරි කොටස දෙවියන් ට ගෙනැවිත් ඔප්පු කිරීමට භාර වෙති. මෙහිදී ප්‍රථම කොටස ලේ සහිත හෙයින් දේවාලයට නොගෙන එයි. අතපසුවීමකින් හෝ ඒ ආකාර දෙයක් ලැබුනොත් අපිරිසිදු කිරි වශයෙන් ඉවත් කරනු ලැබේ. පිරිසිදු හොඳ කිරි කොටසක් පමණක් පූජාවට තබනු ලැබේ. ගවයින්ගේ ලෙඩ රෝග සඳහා විවිධ වූ කෙම් ක්‍රම මේ පුරාණ දේවාලවලින් සිදු කරනු ලැබේ. කෙම් ක්‍රම රහසිගත ය.



පැරණි දේවාලවල කපුරාලවරු පමණක් මෝ දනිති.ඇතැම් ක්‍රම අභාවයට ගොසින් ය.

පිටියේ දේවාල වල "කිල්ල" වැදගත් කරුණක් වශයෙන් සලකනු ලැබේ. මෙය තුන් ආකාරයකි.

I. කොටහලු කිල්ල
II. වැදුගේ කිල්ල
III. මරණ කිල්ල වශයෙනි.

මේ සම්බන්ධයෙන් අභිචාර විධි බහුලය. මේවා කෙරෙහි සැලකිල්ල දැක්වීමට බැතිමතුන් මෙන්ම කපුරාලවරුන් විශේෂයෙන් බැදී සිටිති. මේ කාරණාත්‍රය සම්බන්ධයෙන් **මහනුවර තොරතුරු සංසː ගොඩගම මංගල හිමි, සුමංගල විදුහල මහනුවර (1999) කෘතියට වර්තමාන ලේඛකයා විසින් තොරතුරු සංග්‍රහ කරනු ලැබ තිබේ. (බලන්න එම, පිටු 160- 162)**

පිටියේ දේවාලවල පුද පූජා පැවැත්වෙන දිනයන් වන්නේ ඉරිදා, බදාදා සහ සෙනසුරාදා ය. ඇතැම් දේවාලයක මෙය නූතනයේ දී වෙනස්ව ඇති අයුරු ද පෙනේ. පැමිණෙන බැතිමතුන්ගේ ප්‍රමාණය සැලකීමෙන් හා කපුරාලවරුන්ට ඇති නිදහස අනුව ඉහත දින තුනට අමතරව වෙනත් දිනයන්හි ද පුද පූජා පැවැත්වෙන බව පෙනේ. පුරාණ සිරිත් අනුව කෙම්මුර දින හැටියට යොදා ගනු ලැබූවේ ඉහතින් දක්වන ලද දින තුන පමණි. කපුරාල මහතකුගේ පවුලේ මරණයක් සිදුවුවහොත් දේවාලය විවෘත නොකරන අතර දින කිහිපයක් යන තෙක් කපුරාල මහතා දේවාලයට නොපැමිණීමේ චාරිත්‍රයක් ද පුරාණයේ පැවති බව කියැ වේ.

දේවාලවලට පැමිණෙන බැතිමතුන්ගේ විවිධ අවශ්‍යතා අනුව යාතිකා හා බාර ඔප්පු කරන දේවාල මෙන්ම පොදුවේ සියලුදෙනා වෙනුවෙන් එකවර යාතිකා කරනු ලබන දේවාල ද මේ අතර තිබේ. පුරාණ දේවාලවල පඬුරු බැඳීම ,පළි ගැසීම සිදු කල අතර නූතනයේදී එතරම්ම මෙය සිදු නොවෙයි. පඬුරු බැඳ පළි ගැසීම තුළින් දරුණු ගණයේ විපාක ලබා දෙන බව කියැ

වේ. සොර සතුරන්ට හා තමන්ට විපත් කරන අය සඳහා එබඳු කටයුතු කරන බව විශ්වාස කරති. මෙයට අමතරව සෙසු ප්‍රාර්ථනාවන් වන්නේ සෙත් සාන්තිය ලැබීම හා සශ්‍රීකත්වය ලැබීම යි.

පිටියේ දේවාලවල පුරාණයේ පැවති ඇතැම් චාරිත්‍ර ක්‍රමයෙන් අඩුවන බවකුත් නවීන අංග එකතුවන ආකාරයකුත් දක්නට ඇත. ඇතැම් දේවාල වාණිජකරණයට ලක් වෙමින් පවතී. මෙම දේවාලයන්හි පවත්වනු ලබන විවිධ පුද පූජා විශේෂ අතර වාර්ෂික මංගල්‍යය ප්‍රධාන තැනක් ගනී. මෙය උත්සවශ්‍රීයෙන් සිදු කරන අවස්ථා ඇත. පුරාණ සිරිත් අනුව පැරණි දේවාලවල අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්දට පෙර මෙම මංගල්‍යය සිදු කරනු ලැබේ. මෙයින් බලාපොරොත්තු වන්නේ නව අස්වනුවල අග්‍ර කොටස දෙවියන් වෙනුවෙන් පිදීමයි. අලුත් සහල් මංගල්‍යය වශයෙන් ද නානුමුර මංගල්‍යය වශයෙන් ද මෙම මංගල්‍යය හඳුන්වනු ලැබේ. විශාල පිරිසක් එක්වන මෙම වාර්ෂික මංගල්‍යය රාත්‍රී පහන්වන තුරුම පවත්වනු ලැබේ. පුරාණයේ දී සියලුම දේවාලවල මේ මංගල්‍යය සඳහා "අක්යාල" එකතු කිරීම සිදු කළද වර්තමානයේ දී එ බන්දක් සිදු නොවේ. බැතිමතුන් දේවාලයට අලුත් වී රැගෙන එති.

පූජාව සඳහා අවශ්‍ය සහල් ලබා ගනුයේ මෙම අක්යාල් කොටා පැගීමෙන් පසුවය. හපුගොඩ පිටියේ දේවාලයේ පමණක් දැනට මේ චාරිත්‍රය සිදු කරනු ලැබේ. යක්ගහපිටිය දේවාලයේ සහ හපුගොඩ පිටියේ දේවාලයේ මේ සඳහා විශේෂ ලී ඔරු දෙක බැගින් තිබේ. හපුගොඩ පිටියේ දේවාලයේ වාර්ෂික මංගල්‍යය පිළිබඳ විස්තරයක් වර්තමාන ලේඛකයා මීට පෙරාතුව පළ කොට තිබේ. (බලන්න , මහනුවර තොරතුරු 1998 පිටු 165- 170)

පිටියේ දෙවියන් ඇදහීම පිදීම සම්බන්ධයෙන් බෞද්ධ ජනතාව අතර විශේෂයෙන්ම දුම්බර හා හාරිස්පත්තුවේ පවතින අභිචාර විධි බහුල ය. දේවත්වයෙන් භක්තිමත්ව පුදනු ලබන මෙම දෙවි සම්භවය අතින් පුනර්භවය ලැබූ යක්ෂ ආත්මයකි. ලංකාවේ දේවත්වාරෝපණය වූ පුද්ගල තත්ත්ව අතර රජවරු, ප්‍රභූවරු බහුල ය. මීට කලකට පෙර අභාවප්‍රාප්ත විභාවි ශ්‍රී විජයවර්ධන මහතා "සිංහල රණවිරු දෙවිවරු" යනුවෙන් ලියා පළ කොට ඇති කෘතිය මේ සම්බන්ධයෙන් කදිම ලෙස තොරතුරු සපයයි. මෙයට අමතරව මහාචාර්ය කේ.එන්.ඕ ධර්මදාස හා එච්.එම්.එස් තුන්දෙණිය මහතා සංග්‍රහ කළ "සිංහල දේව පුරාණය" කෘතියේ ද එසේ තොරතුරු බහුල ය. පිටියේ දෙවි සහ නාථ දෙවියන් පිළිබඳව අධ්‍යයනයක යෙදුනු මහාචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල් මහතා ද මෙම දෙවිවරු දෙදෙනා පිළිබඳව තොරතුරු රැසක් ඉදිරිපත් කොට තිබේ. "පිටියේ දෙවියන්" සම්බන්ධව පවතින සහ පැවති පුරාණෝක්ති අනුව තවද පර්යේෂණ සිදුකළ යුතුව ඇත. හේතුව බොහෝ තොරතුරු තවද සැඟව ඇති බැවිනි.



වර්තමානයේ පවතින ස්වරූපය අනුව දේවාල ක්‍රමයෙන් බැතිමතුන්ගෙන් බහුල ලෙස පුද ලබනු ව පෙනී යයි. දෙවියන්ගේ සම්භවය කුමක්ද යන්න සෙවීම නොව අති මහත් භක්තියෙන් මෙම දෙවියන් විශ්වාස කිරීම බැතිමතුන්ගේ සිරිත වී තිබේ. ප්‍රාදේශීය බලවත් දෙවියකු සේ පුද ලබන පිටියේ දෙවියන් ආශ්‍රිත සංස්කෘතික ලක්ෂණය මහනුවර පළාතේ එක්තරා කලාපයකට පමණක් සීමාවී තිබේ.

## ආන්තික සටහන්

[1] ශ්‍රී ධර්මකීර්ති හිමි, නිවන්දම.- (1992) බුදුසමය හා දෙවියෝ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ. පිට xi.

[2] ධර්මදාස, කේ.එන්.ඕ, තුන්දෙනිය, එච්.එම්.එස්.- (1994) සිංහල දේව පුරාණය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ. පිට 5.

[3] හෝල්ට්, ජෝන් ක්ලිෆර්ඩ්.- (1994) පරි. පී. බී. මීගස්කුඹුර, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ. පිටු. (189-190)

[4] ධර්මදාස, කේ.එන්.ඕ, තුන්දෙනිය, එච්.එම්.එස්.- (1994) පිටු (49)

[5] එම. පිටු අංක 303.

[6] සිංහල මහාවංශය (1967) පළමු කොටස, ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ පඬිතුමන්, රත්නකාර, කොළඹ. පිටු. 07.

[7] සාරථී : වෙළුම 06, <u>දුම්බර අඩවියට අධිපති පිටියේ බණ්ඩාර දෙවියෝ, එස්.කේ. ජයවර්ධන</u> (2008) සංස් : වයි.කේ. තිස්ස බණ්ඩාර සහ වෙනත් අය. මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව, පිටු. 59-60

[8] කාරියවසම්, තිස්ස .- (1991) සිරිලක දෙවිවරු, තරංජී ප්‍රින්ටස්, දෙහිවල. පි. 168

[9] inhalverse: Ed. P.E.P. Deranayagala, 1954. Govt. Press, Colombo, P. 25-26

[10] මහාවංශය, සිංහල පරිවර්තනය, (1967) ශ්‍රී සුමංගල නායක හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමන්, රත්නාකර පොත් වෙළඳ සැළ, කොළඹ.

[11] සිංහල සාහිත්‍ය වංශය, (1964) සම්පාදක පුංචි බණ්ඩාර සන්නස්ගල, දෙවන මුද්‍රණය, ලේක්හවුස්, කොළඹ, පිටුව 404.

[12] තෙන්නකෝන්, විමලානන්ද.- (1963) උඩරට මහ කැරැල්ල; ගුණසේන, කොළඹ: පිටු 344-345

[13] වාචිස්සර හිමි, කොටගම.- (1960) සරණඞකර සඞඝරාජ සමය; දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ: පිටු 93-94

[14] ධම්මානන්ද, නාවුල්ලේ.- (1969) මධ්‍යම ලංකා පුරාවෘත්ත; ගුණසේන, කොළඹ: පිටු 37-38

[15] ඩේවි දුටු ලංකාව (1967), අනුවාදක ඇල්ලේපොල එච්. එම්. සෝමරත්න. සංස්කාරක ආචාර්ය විමලානන්ද තෙන්නකෝන්.- කොළඹ: ගුණසේන, පිටුව 101.

[16] එම. පිටු 115.

[17] වික්‍රමසිංහ, ඩී. පී..- (1998) මග දිගට ජනකතා; සූරිය ප්‍රකාශකයෝ, කොළඹ: අප්‍රේල්. පිටු. 111

[18] වීරසේකර, තිස්ස.- (1997) සිංහල ජනශ්‍රැතිවලින් නිරූපිත අපේ සංස්කෘතිය; කොළඹ: ගුණසේන, පිටු. 95-96.

[19] ධීරානන්ද හිමි, කහටපිටියේ.- (1965) ගම්පොළ යුගය; කොළඹ: ගුණසේන, 1965. පිටු. 203-204.

[20] ශ්‍රී ලංකා පුස්කොළපොත් නාමාවලිය.-(1959) කේ. ඩී. සෝමදාස; සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ: පිටු 155.



[21] එම.

[22] හෝල්ට් ජෝන් ක්ලිෆර්ඩ්, පරි. පී. බී. මීගස්කුඹුර.- (1994) මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය; ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ: පිටු 197-198.

[23] හපුගොඩ පිටියේ දේවාලයේ පිටියේ සුරිඳු පුවත පුස්කොළ පිටපත්.

[24] Sinhalverse: Ed. P.E.P. Deranayagala, 1954. Govt. Press, Colombo, P. 25-26

[25] වජිරඤාණ හිමි, ගුන්නෑපාන.- (1960) විහාර වග විත්ති; ගුණසේන, කොළඹ: පිටු 1-4.

[26] සාරථී, වෙළුම 6 පිට 64

[27] මහනුවර තොරතුරු (1999), සංස්. පූජ්‍ය ගොඩගම මංගල හිමි සහ තවත් අය.- <u>මහනුවර ආශ්‍රිත පිටියේ දෙවි ඇදහීම හා හපුගොඩ පිටියේ දේවාලයේ කාල නිර්ණය.</u> වයි.කේ.තිස්ස බණ්ඩාර, පිටු 125 - 153

## ග්‍රන්ථ නාමාවලිය


1. කාරියවසම්, තිස්ස.- (1991) සිරිලක දෙවිවරු, තරංජී ප්‍රින්ටස්, දෙහිවල.
2. තෙන්නකෝන්, විමලානන්ද.- (1963) උඩරට මහ කැරැල්ල; ගුණසේන, කොළඹ
3. ශ්‍රී ධර්මකීර්ති හිමි, නිවන්දම.- (1992) බුදුසමය හා දෙවියෝ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
4. ධර්මදාස, කේ.එන්.ඕ, තුන්දෙනිය, එච්.එම්.එස්.- (1994) සිංහල දේව පුරාණය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ.
5. ධම්මානන්ද, නාවුල්ලේ.- (1969) මධ්‍යම ලංකා පුරාවෘත්ත; ගුණසේන, කොළඹ
6. ධීරානන්ද හිමි, කහටපිටියේ.- (1965) ගම්පොළ යුගය; කොළඹ: ගුණසේන, 1965
7. වජිරඤාණ හිමි, ගුන්නෑපාන.- (1960) විහාර වග විත්ති; ගුණසේන, කොළඹ
8. වාචිස්සර හිමි, කොටගම.- (1960) සරණඞකර සඞඝරාජ සමය; දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ
9. වික්‍රමසිංහ, ඩී. පී..- (1998) මග දිගට ජනකතා; සූරිය ප්‍රකාශකයෝ, කොළඹ: අප්‍රේල්
10. වීරසේකර, තිස්ස.- (1997) සිංහල ජනශ්‍රැතිවලින් නිරූපිත අපේ සංස්කෘතිය; කොළඹ: ගුණසේන
11. හෝල්ට් ජෝන් ක්ලිෆර්ඩ්, පරි. පී. බී. මීගස්කුඹුර.- (1994) මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය; ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ
12. ඩේවි දුටු ලංකාව (1967), අනුවාදක ඇල්ලේපොල එච්. එම්. සෝමරත්න. සංස්කාරක ආචාර්ය විමලානන්ද තෙන්නකෝන්.- කොළඹ: ගුණසේන
13. ශ්‍රී ලංකා පුස්කොළපොත් නාමාවලිය.- (1959) කේ. ඩී. සෝමදාස; සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ
14. මහනුවර තොරතුරු ( 1999 ), සංස්. පූජ්‍ය ගොඩගම මංගල හිමි සහ තවත් අය.- <u>මහනුවර ආශ්‍රිත පිටියේ දෙවි ඇදහීම හා හපුගොඩ පිටියේ දේවාලයෙ කාල නිර්ණය.</u> වයි.කේ.තිස්ස බණ්ඩාර
15. මහාවංශය, සිංහල පරිවර්තනය, (1967) ශ්‍රී සුමංගල නායක හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමන්, රත්නාකර පොත් වෙළඳ සැළ, කොළඹ.

16. සාරථීඃ වෙළුම 06, <u>දුම්බර අඩවියට අධිපති පිටියේ බණ්ඩාර දෙවියෝ, එස්.කේ. ජයවර්ධන</u> (2008) සංස් : වයි.කේ. තිස්ස බණ්ඩාර සහ වෙනත් අය. මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව

17. සිංහල මහාවංශය (1967) පළමු කොටස, ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ පඬිතුමන්, රත්නකාර, කොළඹ

18. සිංහල සාහිත්‍ය වංශය, (1964) සම්පාදක පුංචි බණ්ඩාර සන්නස්ගල, දෙවන මුද්‍රණය, ලේක්හවුස්, කොළඹ

19. හපුගොඩ පිටියේ දේවාලයේ පිටියේ සුරිඳු පුවත පුස්කොළ පිටපත්.

20. 1963- 64 මුදල් වර්ෂය සඳහා පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාව, චාල්ස් ගොඩකුඹුර, 1965 නොවැම්බර්, ලංකාණ්ඩු මුද්‍රණාලය, කොළඹ.

21. Sinhalverse: Ed. P.E.P. Deranayagala, 1954. Govt. Press, Colombo